# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2199/17 - 2020 ඔක්තෝබර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 19/78(vi)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

3 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය එම්. යූ. එම්. අලි සබ්රි වන මා විසින්, අග්‍රවිනිශ්චයකාරවරයා සහ අභියාචනා අධිකරණයේ සභාපතිවරයා විමසා, මේ නියමය මගින්, කලින් කල සංශෝධිත පරිදි වූ 2010 නොවැම්බර් මස 10 වැනි දිනැති අංක 1679/40 දරන අති *විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

i. I වන තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, ''දිසාව'' යන ශීර්ෂය යටතේ II වන තීරුවේ ''1. ගම්පහ'' යන සටහන සහ ඊට අනුරූපීව, ''අධිකරණ බල ප්‍රදේශය '' යන ශීර්ෂය යටතේ IV වන තීරුවේ දැක්වෙන සටහන් වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| ''1. ගම්පහ | ගම්පහ අධිකරණ දිසාව ගම්පහ අධිකරණ කොට්ඨාසයෙන් සංයුක්ත වේ.''; |

ii. I වන තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, II වන තීරුව යටතේ ගම්පහ අධිකරණ දිසාවට අනුරූපීව, III වන තීරුව යටතේ ගම්පහ අධිකරණ කොට්ඨාසයට අනුරූපීව, ''අධිකරණ බල ප්‍රදේශය '' යන ශීර්ෂය යටතේ IV වන තීරුවේ දැක්වෙන අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් එකතු කිරීමෙන් :-

| | |
|---|---|
| ''2. මහර | මහර අධිකරණ දිසාව මහර අධිකරණ කොට්ඨාසයෙන් සංයුක්ත වේ. '' |

iii. I වන තීරුව යටතේ ගම්පහ අධිකරණ කලාපයට අනුරූපීව, II වන තීරුව යටතේ ගම්පහ අධිකරණ දිසාවට අනුරූපීව, III වන තීරුව යටතේ ''කොට්ඨාසය'' යන ශීර්ෂය යටතේ දැක්වෙන ''2. මහර'' යන වචනය සහ ඉලක්කම ඉවත් කර ඒ වෙනුවට ''1. මහර'' යන වචනය සහ ඉලක්කම ආදේශ කිරීමෙන් ;

1A - G 33201 — 75 (2020/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

iv. I වන තීරුවේ ''කලාපය'' යන ශීර්ෂය යටතේ දක්වෙන ''2. ගම්පහ'' යන සටහන සහ ඊට අනුරූපීව, ''අධිකරණ බල ප්‍රදේශය'' යන ශීර්ෂය යටතේ IV වන තීරුවේ දක්වෙන සටහන් වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| ''2. ගම්පහ | ගම්පහ අධිකරණ කලාපය ගම්පහ, පූගොඩ, අත්තනගල්ල සහ මහර යන අධිකරණ දිසාවලින් සංයුක්ත වේ.''; |

**එම්. යූ. එම්. අලි සබ්රි,**
අධිකරණ අමාත්‍ය.

කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.